# පරිසරය සම්බන්ධ නීති

මධ්‍යම පරිසර අධිකාරියේ
නීති නිළධාරිනී
**සන්ධ්‍යා වීරසිංහ**
**විසිනි.**

**ප**රිසර සංරක්ෂණය හා කළමනාකරණය සහ අභිවර්ධනය සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද නීති, රෙගුලාසි, අතුරු නීති පද්ධතිය පරිසර නීති යනුවෙන් පොදුවේ හැඳින්විය හැක.

පරිසර නීති අවශ්‍ය වන්නේ පරිසරය ආරක්ෂා කිරීම සඳහාය. සංවර්ධනයේ පැවැත්ම ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය වන ස්වාභාවික සම්පත් ආරක්ෂා කර ගැනීමත් ඒවා නිසි පරිදි කළමනාකරණය කිරීමත් සඳහා නීති අවශ්‍ය වේ. පරිසර දූෂණය මැඩ පැවැත්වීම සඳහා ද නීති අවශ්‍ය වේ. අපගේ ගංගා, ඇළ – දොළ, වාතය, වෙරළ මුහුද සහ භූමිය ඇතුළු ස්වාභාවික මෙන්ම මානව පරිසරය ජීවත්වීමට හිතකර ආකාරයෙන් පවත්වා ගෙන යාම සඳහා නීති අවශ්‍ය වන්නේ දහසකුත් එකක් මානව ක්‍රියාවලි මගින් පරිසරයට ඇතිවන අධික හානිය පාලනය කිරීම සඳහාය.

ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කිරීම සඳහා නීති පද්ධතියක් ඈත අතීතයේ සිටම පැවති බවට සාක්ෂි දක්නට ඇත. කෙසේ වෙතත් වර්තමාන පරිසර නීති පද්ධතිය හැඩ ගැසීම ආරම්භ වූයේ බ්‍රිතාන්‍ය යුගයේ සිටය. මෙම නීති සෘජුවම පරිසරයට සම්බන්ධ නොවූ නමුත් පරිසරයේ විවිධ අංගයන් සංරක්ෂණය කිරීමේ පරමාර්ථයෙන් පනවනු ලැබූ ඒවා විය.

මෙවැනි මුල් පරිසර නීතියකට දැක්විය හැකි කදිම උදාහරණයක් වන්නේ 1885 දී සම්මත කරනු ලැබූ කැළෑ ආඥා පනතයි. 19 වන ශත වර්ෂයේදී, විශේෂයෙන් 1840 දී මුඩුබිම් පනත සම්මත කර ගැනීමෙන් අනතුරුව, කඳුරට වනාන්තර අතිවිශාල වශයෙන් වතු වගාව සඳහා එළිපෙහෙළි කරන ලද අතර, මින් සිදුවන පරිසර විනාශය පෙන්නා දුන් ප්‍රමුඛ ජීව විද්‍යාඥයකු වන ශ්‍රීමත් ජෝශප් හුකර් අඩි 5000 ට වඩා උසින් වැඩි ප්‍රදේශවල වනාන්තර එළි කිරීම නතර කළයුතු යයි උද්ඝෝෂණය කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් පරිසර සංරක්ෂණය සඳහා කැපවුණු ප්‍රධාන නීතියක් වන ඉහත සඳහන් කැළෑ ආඥා පනත බිහි විය. මෙය පසුව 1907 දී සංශෝධන සහිතව ඉදිරිපත් විය. මෙය පරිසර සංරක්ෂණ නීති ව්‍යුහයේ පැහැදිලි කඩඉමක් සටහන් කරයි.

මුල් කාලයට සම්බන්ධ තවත් වැදගත් ආඥා පනත් වශයෙන් හක්බෙල්ලන් පිළිබඳ ආඥා පනත (1890) සතුන්ට හිරිහැර කිරීම වැළැක්වීමේ ආඥා පනත (1907) පැළෑටි සංරක්ෂණ ආඥා පනත (1924) තල්මසුන් පිළිබඳ ආඥා පනත (1936) දියපාසි පිළිබඳ ආඥා පනත (1909) මුතුපර ආඥා පනත (1925) ඇතුන් ගාල් කිරීම පිළිබඳ ආඥා පනත (1912) උද්භිද උද්‍යාන ආඥා පනත (1928) සත්ව හා වෘක්ෂ ආරක්ෂා කිරීම පිළිබඳ ආඥා පනත (1937) ගස් කැපීම පාලනය කිරීමේ ආඥා පනත (1937) ළිං හා වළවල් පිළිබඳ ආඥා පනත (1884) ගංවතුර වැළැක්වීමේ ආඥා පනත (1920) නිවාස හා නගර සංවර්ධන ආඥා පනත (1915) කර්මාන්තශාලා ආඥා පනත (1942) ආදිය හැඳින්විය හැකිය. මේ හැරුණු විට දණ්ඩ නීති සංග්‍රහයේ ද පරිසර සංරක්ෂණයට අදාළ නීති රීතිදක්නට ලැබේ.

මේවා මුල් කාලයේ දී, විශේෂයෙන් බ්‍රිතාන්‍ය යුගයේ දී වැදගත් වන පරිසර නීති පද්ධතීන් ය. නිදහස ලැබීමෙන් අනතුරුව ද මෙම නෛතික ව්‍යුහය තව තවත් වර්ධනයවීමක් දක්නට ලැබේ. බොහෝ විට 1975 පමණ කාලය දක්වා මේ පනත්වලට සංශෝධන රාශියක් එක්වීමක් දැකිය හැකි වන අතර, නව පනත් වශයෙන් දක්නට ලැබෙන්නේ ගංගා නිම්න භූමි සංවර්ධන පනත (1949) සිවුපාවුන් පිළිබඳ පනත (1958) නගර හා ග්‍රාම නිර්මාණ පනත (1950) පාංශු සංරක්ෂණ පනත ( 1951 ) වැනි පනත්ය.

1980 පමණ වනවිට පරිසරයට අදාළ වන නීති 75 ක් පමණ සංඛ්‍යාවක් අපගේ නීති පොතෙහි ඇතුළත් වී තිබේ. මෙම නීති සළකා බලන විට පහත සඳහන් කරුණු සාරාංශය කළහැක.

1. ලෝකයේ බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවලට වඩා දීර්ඝ කාලයක සිට වර්ධනය වූ පරිසර සංරක්ෂණ නෛතික රාමුවක් දක්නට ලැබීම.

2. පරිසර සංරක්ෂණ නීති පද්ධතීන් බොහෝ විට පරිසරය ආරක්ෂා කිරීමේ මූලික අරමුණින් ඇති කරන ලද ඒවා නොව වෙනත් මූලික අරමුණක් සඳහා පනවන ලද පනතකට පරිසර සංරක්ෂණය ද්විතීය වශයෙන් ඇතුළත් වී තිබීම.

3. මෙම නෛතික ව්‍යුහය මගින් සමහර කොටස් හොඳින් ආවරණය වී ඇති අතර , සමහර අංශ කොහෙත්ම ආවරණය නොවීම. උදා :– කර්මාන්තශාලා ආඥා පනත ගත හොත්, මේ මගින් කර්මාන්තශාලාවක් තුළ පරිසර දූෂණය වැළැක්වීමට නීතිමය පියවර ගතහැකි වුවත් කර්මාන්ත ශාලාවේ තාප්පයෙන් එපිටට අපද්‍රව්‍ය ඉවත් කළහොත් ගතහැකි නෛතික පියවරක් නොමැත.

4. ඉතාමත් වැදගත් ලක්ෂණය වන්නේ මෙම නීති බොහොමයක් ක්‍රියාත්මක නොවීමයි. බොහෝ නීති, පොතට පමණක් සීමා විය. පරිසරාත්මක කරුණු හැම විටම ද්විතීය තැනට වැටුන නිසාත්, බොහෝ විට වෙනත් මූලික අරමුණක් මත නීති සකස් කර තිබූ හෙයින් සහ නීති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වූ වයඃප්‍රාත්මක පිටුවහල නොතිබුණ නිසාත් නීති ක්‍රියාත්මක වීම සිදු නොවූ බව පෙනී යයි. සමහර අවස්ථාවන්හිදී පරිසර නීති ක්‍රියාත්මක නොකරන ලෙසට තීරණ ගත් බවක් ද සඳහන් වේ. මේ අන්දමට පාංශු සංරක්ෂණ නීති ක්‍රියාත්මක නොකරන ලෙස සමහර දිස්ත්‍රික් කමිටුවලදී තීරණ ගනු ලැබූ බව ද ප්‍රකාශිතය.

5. බොහෝ නීති නිසි අයුරින් කාලීනව සකස් නොකෙරුනි. මේ නිසා බොහොමයක් නීති කල්පැන ගිය ඒවා ලෙස හැඳින්විය හැකිය. ඒවා යේ දඬුවම් කාලයට උචිත නොවේ. උදා :- සමහර වැරදි වලට දඩ මුදල (රු: 5/-, රු: 10/- වැනි) තවමත් ඒ ආකාරයෙන්ම දක්නට ලැබේ.

6. නීති ක්‍රියාත්මක කිරීමේ දී මතුවන දුෂ්කරතා :

බොහෝ පරිසර නීති ක්‍රියාත්මක කිරීමේ දී දුෂ්කරතාවන් රැසක් මතු වී ඇති බව නිතර ප්‍රකාශ වන කරුණකි. එම නීති නිසි අයුරු සකස් කර නොමැති හෙයින් බොහෝ විට නීතියේ රැහැනට හසුවන පුද්ගලයන්ට පහසුවෙන් ගැලවී යාමට අවස්ථාව සැලසී ඇත.

ජාතික මට්ටමේ මෙම නෛතික ව්‍යුහයට අමතරව පළාත් පාලන ආයතන සතුවන අතුරු නීති රාශියක්, පරිසර සංරක්ෂණයට ඉලක්ක වී ඇත. මෙම අතුරු නීති මගින් විශේෂයෙන් නාගරික කලාපීය ප්‍රදේශවල පරිසර සංරක්ෂණ යේ නෛතික පදනම බොහෝ දුරට ශක්තිමත් වී තිබේ. නමුත් මූලික ගැටළුව මෙම අතුරු නීති නිසි ආකාරව ක්‍රියාත්මක නොවීමයි. බොහෝ නීති ක්‍රියාත්මක නොවීම නිසා යළි පණ ගැන්වීමට ඉතා අසීරු තත්ත්වයකට පත් වී ඇත.

1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත ශ්‍රී ලංකාවේ පරිසර නීති ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් පෙන්නුම් කරයි. මෙයට මූලික හේතුව පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය සඳහා පමණක් සම්බන්ධ වූ පළමු නීතිය මෙයවීමයි. මෙය මෙතෙක් ශ්‍රී ලංකා ඉතිහාසයේ සමස්ථ පරිසරය සම්බන්ධයෙන් ඉදිරිපත් වූ එකම පනත වේ. මේ පනත සෘජුවම පරිසර සංරක්ෂණය සඳහා කැප වී තිබීම එහි තවත් වැදගත් ලක්ෂණයකි.

1980 පනවනු ලැබූ ජාතික පාරිසරික පනත, 1981 අගෝස්තු මස 12 දින සිට ක්‍රියාත්මක විය. මේ පනත යටතේ පිහිටවනු ලැබූ මධ්‍යම පරිසර අධිකාරිය ක්‍රියා කළේ පරිසර කටයුතු පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ සහ පරිසර කටයුතු සමායෝජනය කිරීමේ ආයතන යක් වශයෙන් පමණි. මේ පනත යටතේ ක්‍රියාකාරී බලතල නොමැතිවීම විශේෂ ලක්ෂණයක් විය.

කෙසේ වෙතත් 1988 දී මේ පනතට කරන ලද සංශෝධනයෙන් පරිසරය ආරක්ෂා කිරීමට ද, පරිසර දූෂණය වැළැක්වීමට සහ ව්‍යාපෘතීන් මඟින් පරිසරයට වියහැකි බලපෑම් ඇගයීම සඳහා නීති ක්‍රියාත්මක කිරීමේ බලතල ලැබිණ.

ජාතික පරිසර පනතේ මූලික පරමාර්ථය වූයේ මධ්‍යම පරිසර අධිකාරියක් පිහිටුවීම පරිසරය ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම, පරිසරය අභිවර්ධනය කිරීම, එහි තත්ත්වය විධිමත් කිරීම පාලනය කිරීම සහ පරිසර දූෂණය වැළැක්වීමයි. මේ පනත දළ වශයෙන් කොටස් පහකින් සකස් වී තිබේ. මධ්‍යම පරිසර අධිකාරිය සහ පාරිසරික සභාවක් පිහිටුවීම, අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්‍ය්‍ය , අධිකාරියේ කාර්‍ය්‍ය මණ්ඩලය පාරිසරික කළමනාකරණය යනුවෙන් මේ කොටස් පහ නම් කර ඇත. 1988 සංශෝධනය යටතේ IV ඒ, IV බී සහ IV සී (IVඒ පාරිසරික ආරක්ෂාව යනුවෙන් අළුත් කොටස් 3 ක් ඇතුළත් විය. (IV ආ) පාරිසරික තත්ත්වය සහ (IV ඇ) ව්‍යාපෘතීන් අනුමත කිරීම යන අනු කොටස් තුනක් මුල් පනතේ ඇතුලත් කර ඇත.

ජාතික පාරිසරික පනත යටතේ නියෝග පැනවිය හැකිවන අතර මෙසේ සාදනු ලැබූ පළමු නියෝග 1990 අංක 01 දරණ ජාතික පාරිසරික (ආරක්ෂණ සහ තත්ව) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ. මේ නියෝග මගින් පරිසර දූෂණය වැළැක්වීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ වැඩපිළිවෙලක් සඳහන් කර ඇත. මේ වැඩපිළිවෙල 1990 ජූලි මස 01 වනදා සිට ක්‍රියාත්මක විය. එමගින් අපද්‍රව්‍ය පරිසරයට නිකුත් කිරීම, බැහැර කිරීම සහ තැන්පත් කිරීම කළහැක්කේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ සහ ජාතික පාරිසරික පනත යටතේ නියම කරන ප්‍රමිතිවලට අනුකූලව පමණි.

ජාතික පාරිසරික පනත හැරුණු විට මෑත කාලයේ දී පරිසරයට අදාළ තවත් වැදගත් නීති රැසක්ම සම්මත විය. මේවා අතර‘ 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත 1981 අංක 59 දරන සමුද්‍රීය පරිසර දූෂණ වැළැක්වීමේ පනත 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතන පනත 1976 අංක 22 දරන

(ඉතිරිය 28 පිටුවට)



(19 වැනි පිටු වෙන්)

## පරිසර සම්බන්ධ නීති....

වෙරළ කළාප පනත, 1976 අංක 04 දරන මහකොළඹ ආර්ථික කොමිසන් සභා පනත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත, 1979 අංක 23 දරන මහවැලි අධිකාරි පනත 1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත වැදගත් තැනක් ගනී.

පරිසර සංරක්ෂණය, කළමනාකරණය සහ අභිවෘධිය සඳහාම මූලික වශයෙන් කැපවුණු පරිසර නීතියක් වර්ධනයවීම ආරම්භ වූයේ ඉතාමත්ම මෑතකදී වන හෙයින් පරිසර නීතිය තවමත් සකස් වෙමින් පවතින බව පැවසිය හැකියි. වර්තමානයේ පවත්නා නීතිරීති වල අඩුපාඩුකම් අවබෝධ කර ගැනීමෙන් මෙන්ම ක්‍රමයෙන් වෙනස් වෙමින් පවතින නූතන ලෝකයේ අවශ්‍යතාවන්ට සරිලන පරිද්දෙන් පරිසර නීතිය ද තව දුරටත් වර්ධනයවීම, අනිවාර්යයෙන්ම සිදු වියයුතුය.